# කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

# පුරප්පාඩු
# පොල් පර්යේෂණ ආයතනය

පොල් පර්යේෂණ ආයතනයේ පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. <u>අතිරේක අධ්‍යක්ෂ තනතුර - පුරප්පාඩු 01</u>

**වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද:**

**බාහිර :**

**වෘත්තීය සුදුසුකම් :** දෙවන පෙළ ඉහළ හෝ ඊට වැඩි සාමාර්ථයක් සහිත සිව් අවුරුදු (4) විද්‍යා හෝ කෘෂිකර්ම උපාධිය සහ අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධිය (Ph.D.)

**පළපුරුද්ද** : පිළිගත් ආයතනයක අවම වශයෙන් වසර දහඅටක (18) පර්යේෂණ/ කළමනාකරණ මට්ටමේ පර්යේෂණ පළපුරුද්ද. එයින් වසර දහයක් (10) ආචාර්ය උපාධිය (Ph.D.) ලබා ගැනීමෙන් පසුව විය යුතු අතර, අවම වශයෙන් වසර තුනක් (3) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.

**සහ**

: විවිධ ක්ෂේත්‍රවල පර්යේෂණ කණ්ඩායම් සඳහා නායකත්වය ලබා දීමේ සහ මෙහෙයවීමේ හැකියාව පෙන්නුම් කළ යුතුය.

සටහන : මානව සහ සෙසු සම්පත් පිළිබඳ මනාව පැතිරුණු හා කාර්යක්ෂම කළමනාකරණ පළපුරුද්ද අමතර සුදුසුකමක් සේ සලකනු ලැබේ.

අභ්‍යන්තර

**වෘත්තීය සුදුසුකම් :** අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධිය (Ph.D.)

**පළපුරුද්ද** : පොල් පර්යේෂණ ආයතනයේ අංශ ප්‍රධානී / ප්‍රධාන පර්යේෂණ නිලධාරි / ප්‍රධාන තාක්ෂණ භුවමාරු නිලධාරි ලෙස අවම වශයෙන් වසර හයක (6) සතුටුදායක සේවයක් සපුරා තිබීම.

**සහ**

: විවිධ ක්ෂේත්‍රවල පර්යේෂණ කණ්ඩායම් සඳහා නායකත්වය ලබා දීමේ සහ මෙහෙයවීමේ හැකියාව පෙන්නුම් කළ යුතුය.

සටහන : මානව සහ සෙසු සම්පත් පිළිබඳ මනාව පැතිරුණු හා කාර්යක්ෂම කළමනාකරණ පළපුරුද්ද අමතර සුදුසුකමක් සේ සලකනු ලැබේ.

- **වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 40 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 50 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.

- **වැටුප් කාණ්ඩය** : HM 2-1

- **වැටුප් පරිමාණය** : 91,645-12x2,700-124,045/-

- **ආරම්භක වැටුප් තලය** : රු.91,645.00 [කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2/2016(I) අනුව]

- **අනෙකුත් ප්‍රතිලාභ** :

  මූලික වැටුපට අමතරව පහත සඳහන් දීමනා ද ගෙවනු ලැබේ.

  i. ජීවන වියදම් දීමනාව - රු.17,800/-
  ii. ප්‍රවාහන දීමනාව 50,000/- හෝ වෙන් කරන ලද නිල වාහනය
  iii. ඉන්ධන දීමනාව
  iv. සන්නිවේදන දීමනාව
  v. වෘත්තීය දීමනාව
  vi. තේ දීමනාව
  vii. ගාස්තු රහිතව අංගසම්පූර්ණ නිල නිවාස පහසුකම් (කම්කරුවකු සහිත)

## 02. <u>පර්යේෂණ නිලධාරි තනතුර</u>

- **ශාක කායික විද්‍යා අංශය - පුරප්පාඩු 01**
- **කෘෂි ආර්ථික විද්‍යා සහ කෘෂි ව්‍යාපාර කළමනාකරණ අංශය - පුරප්පාඩු 01**

**වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද:**

**බාහිර :**

පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් පළමු පෙළ හෝ දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් සහිත සිව් අවුරුදු (4) විශේෂ විද්‍යා හෝ කෘෂිකර්ම උපාධිය

**හෝ**

පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් දෙවන පෙළ පහළ සාමාර්ථයක් සහිත සිව් අවුරුදු (4) විශේෂ විද්‍යා හෝ කෘෂිකර්ම උපාධිය සමග අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් එක් අවුරුදු (1) පශ්චාත් උපාධිය.

**හෝ**

පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් විද්‍යා හෝ කෘෂිකර්මය උපාධිය සහ අදාළ ක්ෂේත්‍රයේ දෑ අවුරුදු (2) පශ්චාත් පර්යේෂණ උපාධිය.

- **වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත

- **වැටුප් කාණ්ඩය** : AR 1

- **වැටුප් පරිමාණය** : රු. 53,150-10x1,375-15x1,910-95,550/-

- **ආරම්භක වැටුප් තලය** : රු. 53,150.00 [කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2/2016(I) අනුව]

- **අනෙකුත් ප්‍රතිලාභ :**

  මූලික වැටුපට අමතරව පහත සඳහන් දීමනා ද ගෙවනු ලැබේ.

  i. ජීවන වියදම් දීමනාව - රු.17,800/-
  ii. වෘත්තීය දීමනාව
  iii. සන්නිවේදන දීමනාව
  iv. තේ දීමනාව

**<u>පොදු කොන්දේසි</u>**

1. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
2. අයදුම්කරු මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් පසුවිය යුතුයි.
3. අයදුම්කරු දිවයින තුළ ඕනෑම ස්ථානයක සේවය කිරීමට කැමති විය යුතුයි.

**<u>පොදු ප්‍රතිලාභ</u>**

1. 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා පනත යටතේ හා 2016.04.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2/2016 අනුව පාරිතෝෂික ගෙවනු ලැබේ.
2. දායකත්ව වෛද්‍යාධාර යෝජනා ක්‍රමයට හිමිකම් ඇත.
3. අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තියන්ගේ භාර අරමුදල (අපේක්ෂකයන් විසින් වැටුපෙන් 10% ක් හා මණ්ඩලය විසින් 15% ක් අර්ථසාධක අරමුදල සඳහා සහ 3% ක් සේවා නියුක්තියන්ගේ භාර අරමුදල සඳහාද දායක වනු ඇත.)
4. පොල් පර්යේෂණ ආයතනයේ සේවකයින් හට ලැබෙන අනෙකුත් ප්‍රතිලාභ ද හිමිවනු ඇත

අයදුම්කරුවන් විසින් <u>උප්පැන්න සහතිකය සහ අනෙකුත් අදාළ සියලුම අධ්‍යාපන හා වෙනත් සහතිකපත්වල පිටපත් සහ චරිත සහතික දෙකක් (ඉන් එකක් ග්‍රාම නිලධාරිගෙන් විය යුතුය), ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංක ද සමග අයදුම්කරු විසින් **අත්සන් කරන ලද**</u> තම අයදුම්පත **<u>2024.05.07</u>** වන දින හෝ ඊට පෙර ලැබෙන සේ **සභාපති, පොල් පර්යේෂණ මණ්ඩලය, ලුණුවිල 61150** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ප්‍රමාද වී එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රජයේ දෙපාර්තමේන්තු/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන නිලධාරීන් තම අයදුම්පත් ඔවුන්ගේ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පතේ පිටපතක් සෘජුවම එවිය හැකිය.

ලිපි කවරයේ වම්පස ඉහල කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

අදාල සහතිකවල පිටපත් නොමැතිව එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන බව කාරුණිකව සලකන්න.

**මේ පිළිබඳව බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත.**

මෙම දැන්වීම පොල් පර්යේෂණ ආයතනයේ නිල වෙබ් අඩවිය වන www.cri.gov.lk හි ද පළකර ඇත.

සභාපති
පොල් පර්යේෂණ මණ්ඩලය
ලුණුවිල

2024.04.19